පොලිස් මූලස්ථානය, කොළඹ, ශ්‍රී ලංකාව
பொலிஸ் தலைமையகம், கொழும்பு, இலங்கை
POLICE HEAD QUARTERS, COLOMBO, SRI LANKA

| | | | | |
|---|---|---|---|---|
| තැ. පෙ. අංකය<br>த. பெ .இல.<br>P. O. Box No. | 517 | | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax No. | 011- 2329500 |
| දුරකථනය<br>தொலைபேசி<br>Telephone | 011-2384024<br>011-2395605 | Website: www.police.lk | ඊ - මේල්<br>மின்-அஞ்சல்<br>E-Mail | Policemedia@police.lk |

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | |


**2020.04.01 පැය 1210**
**ප්‍රවෘත්ති අධ්‍යක්ෂ / කර්තෘ,**
**මහත්මයාණනි / මහත්මියණි,**

## අන්තර්ජාලය ඔස්සේ අසත්‍ය හෝ ද්වේශසහගත ප්‍රකාශ පළ කරන පුද්ගලයින්ට එරෙහිව දැඩි නීතිමය පියවර.

COVID 19 හෙවත් නව කොරෝනා වෛරසය ශ්‍රී ලංකාව තුළ පැතිරීම වැලැක්වීම සඳහා රාජ්‍ය අංශයේ උපරිම දායකත්වය එම ආයතනවල සේවකයින් විසින් මනා කැපවීමකින් යුක්තව ලබාදෙනු ලබයි.

එම රාජකාරී, විවේචනය කරමින් සහ එම නිලධරයන්ගේ සුළු අඩුපාඩු මතුකර පෙන්වමින් ඉතා බරපතල ලෙස එම රජයේ සේවකයින්ගේ රාජකාරියට බාධා කරමින් සහ ඔවුන්ට බැන තර්ජනය කරමින් අසත්‍ය හෝ ද්වේශසහගත ප්‍රකාශ ඇතුළත් වීඩියෝ දර්ශන සහ වෙනත් පළකිරීම්, අන්තර්ජාලය තුළ ප්‍රසිද්ධ කරන බව වාර්තා වී ඇත.

එම තැනැත්තන්ට එරෙහිව ඉතා තදින් නීතිය ක්‍රියාත්මක කිරීමටත් එම තැනැත්තන් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර ඉදිරි නීතිමය පියවර ගන්නා ලෙසත් වැඩබලන පොලිස්පති තුමා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පතිවරයා සහ දිවයිනේ සියලු ම පොලිස් ස්ථානාධිපතිවරුන් වෙත උපදෙස් ලබාදී ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය,**
**පොලිස් මූලස්ථානය,**
**කොළඹ 01.**